ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ජනවාරි මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 ජනවාරි මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් **පත්‍රයේ II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : ශත 65 යි** **තැපැල් ගාස්තුව : ශත 50 යි**

# 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජනවාරි මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 56/80.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිණිස වූ ඡන්ද විමසීමේ කාර්ය පටිපාටිය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*මේ පනතේ විධිවිධාන අදාළ කිරීම.*

**2.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 වන ව්‍යවස්ථාවෙහි (1) වන අනු ව්‍යවස්ථාව ප්‍රකාර ජනාධිපතිවරයාගේ ධුරය හිස් වූ අවස්ථාවක දී, මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

*ඇතැම් අවස්ථාවල දී පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගත යුතු බව.*

**3.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 වන ව්‍යවස්ථාවෙහි (1) වන අනුව්‍යවස්ථාවේ (ඊ) අනුඡේදය හැරුණු විට එම (1) වන අනුව්‍යවස්ථාව ප්‍රකාර ජනාධිපතිවරයාගේ ධුරය හිස්වූ අවස්ථාවකදී, ජනාධිපති ධුරයට තෝරා පත් කර ගැනීමට සුදුසුකම් ඇත්තා වූ මන්ත්‍රීවරයන් අතුරින් යම් මන්ත්‍රීවරයකු, ධුරය හිස් කළ ජනාධිපතිවරයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති ධුර කාලය තුළ ධුරය දැරීම සඳහා, ජනාධිපතිවරයා වශයෙන් පාර්ලිමේන්තුව විසින් තෝරා පත් කර ගත යුතු ය.

(2) ඒ තෝරා පත් කර ගැනීම, පුරප්පාඩුව සිදු වූ දිනට පසුව, හැකි ඉක්මණින් ද එදින සිට කිසිදු අවස්ථාවක දී මාස එකක් නොඉක්මවා ද පවත්වනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ පුරප්පාඩුව පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසු සිදු වුවහොත්, නව පාර්ලිමේන්තුව විසින් එහි ප්‍රථම රැස්වීමෙන් මාස එකක් ඇතුළත දී ජනාධිපතිවරයා තෝරා පත්කර ගත යුතු ය.

*පුරප්පාඩුවක් ඇතිවීම, පාර්ලිමේන්තුව කැඳවීමක් වශයෙන් ක්‍රියාත්මක විය යුතු බව.*

**4.** පාර්ලිමේන්තුව විසුරුවා හැර නොමැති අවස්ථාවක, ජනාධිපති ධුරයේ පුරප්පාඩුවක් ඇති වූ විට, ඒ පුරප්පාඩුව, එය ඇති වී දින තුනක් ඇතුළත රැස්වීම සඳහා පාර්ලිමේන්තුව කැඳවීමක් සේ ක්‍රියාත්මක විය යුතු ය. ඒ රැස්වීම සඳහා නියමිත දිනය සහ වේලාව (මෙහි මින් මතු "මහ ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්හට දැනුම් දිය යුතු ය.

*මහ ලේකම්වරයා විසින් පුරප්පාඩුව පාර්ලිමේන්තුවට දන්වා සිටිය යුතු බව.*

**5.** 4 වන වගන්තියට අනුකූලව පාර්ලිමේන්තුව රැස් වූ විට දී ජනාධිපති ධුරයෙහි පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව මහ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවට දන්වා සිටිය යුතු ය. ඒ රැස්වීමේ දිනයෙහි සිට පැය හතළිස් අටකට කලින් නොවන්නා වූ සහ දින හතකට පසු නොවන්නා වූ දිනයක නාම විසින් නාම යෝජනා භාර ගනු ලබන දිනයක් සහ වේලාවක් නියම කළ යුතු ය.

2—ඒ 51461—14.000 (80/09)

නාම යෝජනා දිනය

**6.** (1) නාම යෝජනා භාර ගැනීම සඳහා නියම කරනු ලැබූ දිනයේ දී, පාර්ලිමේන්තුව රැස් විය යුතු අතර, මහ ලේකම්වරයා, තේරීම් භාර නිලධරයා වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(2) ජනාධිපති ධුරය සඳහා තෝරා පත් කර ගනු ලැබීමට මන්ත්‍රීවරයකු යෝජනා කිරීමට අදහස් කරන්නා වූ සෑම මන්ත්‍රීවරයකු ම, තමා විසින් එසේ යෝජනා කරනු ලබන මන්ත්‍රීවරයා තෝරා පත් කර ගනු ලැබුවහොත්, ඒ ධුරයෙහි සේවය කිරීමට ඔහු කැමති බවට වූ ලිඛිත එකඟත්වය කලින් ලබාගත යුතු ය.

(3) මන්ත්‍රීවරයකු තමා විසින් ම මහ ලේකම්වරයා අමතමින්, පාර්ලිමේන්තුවට පැමිණ සිටින වෙනත් යම් මන්ත්‍රීවරයකු ජනාධිපති ධුරය සඳහා යෝජනා කළ යුතු ය. වෙනත් මන්ත්‍රීවරයකු විසින් ඒ යෝජනාව ස්ථිර කරනු ලැබිය යුතු නමුත්, විවාදයක් පැවැත්වීමට ඉඩ නොදිය යුතු ය.

(4) ජනාධිපති ධුරය සඳහා එක් මන්ත්‍රීවරයකු පමණක් එසේ යෝජනා කරනු ලැබ ස්ථිර කරනු ලැබී නම්, මහ ලේකම්වරයා විසින්, ඔහු ඒ ධුරය සඳහා තෝරා පත්කර ගනු ලැබූ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය. එක් මන්ත්‍රීවරයකුට වඩා වැඩි දෙනකු එසේ යෝජනා කරනු ලැබ, ස්ථිර කරනු ලැබුවේ නම්, 3 වන වගන්තියේ (2) වන උපවගන්තියට යටත්ව ඡන්දය විමසීම සඳහා දිනයක් සහ වේලාවක් පාර්ලිමේන්තුව විසින් නියම කළ යුතු ය. එම දිනය නාම යෝජනා පත්‍ර භාරගැනීමේ වේලාවෙන් පැය හතළිස් අටකට පසුව වූ දිනයක් නොවිය යුතු ය.

ඡන්දය විමසන දිනයේ දී කාර්ය පටිපාටිය.

**7.** (1) ඡන්දය විමසීම සඳහා නියම කරනු ලැබූ දිනයේ දී, මහ ලේකම්වරයා, තේරීම් භාර නිලධරයා වශයෙන් ක්‍රියා කළ යුතු අතර, ඡන්ද විමසීම පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සියලු කරුණු පහත සඳහන් විධිවිධානවලට යටත්ව කරනු ලැබිය යුතු ය.

(2) ඡන්දය දීම ආරම්භ කිරීමට පෙර, තේරීම් භාර නිලධරයා විසින් හිස් ඡන්ද පෙට්ටිය හෝ පෙට්ටි මන්ත්‍රීවරුන්ට පෙන්වා ඉන් පසු ඔවුන් ඉදිරියේ දී අවස්ථාමෝචිත පරිදි, එයට හෝ ඒවාට මුද්‍රා තැබිය යුතු ය.

(3) ඡන්දය දීම ආරම්භ කළ විට, තේරීම් භාර නිලධරයා විසින් කථානායකවරයා ඇතුළුව එක් එක් මන්ත්‍රීවරයාගේ නම අඬ ගසනු ලැබිය යුතු අතර, ඒ එක් එක් මන්ත්‍රීවරයා තේරීම් භාර නිලධරයාගේ මේසය වෙත ගොස් ඡන්ද පත්‍රිකාවක් ලබා ගත යුතු ය. ඒ මන්ත්‍රීවරයා ඉදිරියේ දී තේරීම් භාර නිලධරයා විසින් ඡන්ද පත්‍රිකාවේ පසු පැත්තෙහි ස්වකීය නාමේ මුලකුරු සහිතව කෙටි අත්සන තැබිය යුතු ය.

(4) ඡන්ද පත්‍රිකාවක් ලබා ගත් මන්ත්‍රීවරයා, ඉන් පසු සභා ගර්භයෙහි තබා ඇති කුටිය වෙත ගොස් තමාගේ ඡන්ද පත්‍රිකාව ලකුණු කළ යුතු ය.

(5) සෑම ඡන්ද පත්‍රිකාවක් ම මෙහි උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු අතර, සියලුම ඡන්ද අපේක්ෂකයන්ගේ නම් එහි ඇතුළත් විය යුතු ය.

(6) මන්ත්‍රීවරයකු ඡන්ද පත්‍රිකාවක් ලැබූ විට දී, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට, තමා ඡන්දය දීමට කැමැත්තේ කාහට ද යන්න එහි පෙන්නුම් කළ යුතු ය. ඊටපසු මන්ත්‍රීවරයා

විසින්, ඡන්ද පත්‍රිකාවෙහි ඇති තේරීම් භාර නිලධරයාගේ කෙටි අත්සන පෙනෙන පරිදි ඒ ඡන්ද පත්‍රිකාව නවා, කෙටි අත්සන තේරීම් භාර නිලධරයාට පෙනෙන ආකාරයට ඡන්ද පත්‍රිකාව තබා ගෙන, තේරීම් භාර නිලධරයාගේ මේසය මත තබා ඇති ඡන්ද පෙට්ටියට හෝ ඡන්ද පෙට්ටි එකකට වඩා ඇත්නම්, ඒ ඡන්ද පෙට්ටි වලින් එකකට හෝ ඡන්ද පත්‍රිකාව දැමිය යුතු ය.

(7) මන්ත්‍රීවරයකු විසින් අනවධානයෙන් ඡන්ද පත්‍රිකාවක් නරක් කරන ලද්දේ නම්, එය තේරීම් භාර නිලධරයාට ආපසු දිය හැකි අතර, ඒ අනවධානය පිළිබඳව තේරීම් භාර නිලධරයා සෑහීමට පත් වන්නේ නම්, වෙනත් ඡන්ද පත්‍රිකාවක් ඔහුට දිය යුතු ය. තවද, නරක් වූ ඡන්ද පත්‍රිකාව ඒ තේරීම් භාර නිලධරයා විසින් නොපමාව ම අවලංගු කළ යුතු ය.

(8) ඡන්දය දීම අවසන් විය යුතු වේලාවට පෙර, තේරීම් භාර නිලධරයා විසින්, (3) වන උපවගන්තිය යටතේ නම අඬ ගැසූ විට ඡන්දය නුදුන් යම් මන්ත්‍රීවරයකුගේ නම දෙවන වරටත් අඬ ගැසිය යුතු ය. දෙවන වරටත් තමාගේ නම අඬ ගසනු ලැබූ පසු ඒ මන්ත්‍රීවරයා ඡන්දය නොදෙන්නේ නම් ඔහු ඡන්දය දීමෙන් වැළකී සිටිය ලෙස සලකනු ලැබිය යුතු ය.

8. එක් මන්ත්‍රීවරයකුට එක් ඡන්දයක් පමණක් තිබිය යුතු ය. කිසිම ඡන්දයක් ප්‍රතියුක්තිකයකු මඟින් නොදිය යුතු ය. මන්ත්‍රීවරයකු, තමාගේ ඡන්දය දීමේ දී— ඡන්දය දෙන ආකාරය.

(අ) තමා ඡන්දය දෙන්නේ යම් අපේක්ෂකයකුට ද, තම ඡන්ද පත්‍රිකාවෙහි ඒ අපේක්ෂකයාගේ නම ඉදිරියෙන් වූ කොටුවෙහි 1 යන ඉලක්කම යෙදිය යුතු ය ; තවද

(ආ) මීට අමතරව, ඡන්ද අපේක්ෂකයන්ගේ නම් ඉදිරියෙන් වූ කොටුවල, 2 යන ඉලක්කම හෝ 2 සහ 3 යන ඉලක්කම් හෝ 2, 3 සහ 4 යන ඉලක්කම් ඇදී වශයෙන් හෝ තම මනාපයන්හි අනුපිළිවෙල අනුව ඡන්ද පත්‍රිකාවෙහි යෙදිය හැකි ය.

9. (අ) මන්ත්‍රීවරයා හඳුනා ගත හැකි යම්කිසි දෙයක් ලියා ඇති හෝ සලකුණු කර ඇති ඡන්ද පත්‍රිකාවක් ; හෝ ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප කිරීම.

(ආ) තේරීම් භාර නිලධරයාගේ කෙටි අත්සන නොදරන ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඇ) 1 යන ඉලක්කම සලකුණු කරනු නොලැබූ ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඈ) එක් ඡන්ද අපේක්ෂකයකුගේ නාමයට වඩා වැඩි ගණනකගේ නම් ඉදිරියෙන් 1 යන ඉලක්කම ලකුණු කර ඇති ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඉ) සලකුණු නොකරන ලද හෝ අවිනිශ්චිතතාවය නිසා බලරහිත වන්නා වූ ඡන්ද පත්‍රිකාවක්

අවලංගු විය යුතු ය.

10. (1) තේරීම් භාර නිලධරයා විසින් ඡන්ද පත්‍රිකා පරීක්ෂා කළ යුතු අතර, අවලංගු වූ යම් ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප කිරීමෙන් පසු ඉතිරි ඡන්ද පත්‍රිකා එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් ගණන් කිරීම.

සටහන් කරනු ලැබූ පළමුවන මනාපයන් අනුව, වෙන් කළ යුතු ය. ඊට පසු ඔහු එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් සටහන් කරනු ලැබූ මනාපයන් සංඛ්‍යාව ගණන් කළ යුතු ය.

(2) ඡන්ද ගණන් කිරීමේ දී පැමිණ සිටීමට යම් ඡන්ද අපේක්ෂකයෙක් කැමැත්තෙහි නම්, ඔහුට එසේ කළ හැකි ය. නැතහොත් ගණන් කිරීමේ දී තමා නියෝජනය කිරීමට වෙනත් මන්ත්‍රීවරයකු පත් කිරීමට ඔහු කැමැත්තෙහි නම්, ඒ මන්ත්‍රීවරයාගේ කැමැත්ත ලබා ගැනීමෙන් පසු ඔහු විසින් ඒ බව තේරීම් භාර නිලධරයාට දැන්විය හැකි ය.

අපේක්ෂකයකු ඒකාන්ත බහුතර ඡන්දයක් ලබන අවස්ථාවෙහි ප්‍රකාශයට පත් කිරීම.

**11.** දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට වැඩි ඡන්ද සංඛ්‍යාවක් යම් අපේක්ෂකයකු ලබා ගත්තේ නම්, ඒ අපේක්ෂකයා ජනාධිපති ධුරයට තෝරා පත් කර ගනු ලැබූ බව තේරීම් භාර නිලධරයා විසින් නොපමාව ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

කිසිම අපේක්ෂකයකු ඒකාන්ත බහුතර ඡන්දයක් ලබා නොගත් කල අවස්ථාවක දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

**12.** (1) දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට වැඩි ඡන්ද සංඛ්‍යාවක් කිසිම අපේක්ෂකයකුට ලැබී නොමැති අවස්ථාවක දී, අඩුතම ඡන්ද සංඛ්‍යාව ලබාගත් අපේක්ෂකයා තේරීම් භාර නිලධරයා විසින් තරගයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය. තව ද එසේ තරගයෙන් ඉවත් කරන ලද අපේක්ෂකයාට ඡන්දය දුන් එක් එක් මන්ත්‍රීවරයා තම දෙවන මනාපය සටහන් කර ඇත්තේ යම් අපේක්ෂකයකු සඳහා ද ඒ අපේක්ෂකයාට ලැබුණු ඡන්දයක් ලෙස ඒ දෙවන මනාපය ගණන් කරනු ලැබිය යුතු අතර ඒ අපේක්ෂකයාගේ වාසියට එවකටත් ගණන් කර ඇති ඡන්ද සංඛ්‍යාවට යටකී පරිදි ගණන් කරනු ලැබූ දෙවන මනාපය එකතු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි තරගයෙන් ඉවත් කර ගණන් කිරීමෙන් පසු දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට වැඩි ඡන්ද සංඛ්‍යාවක් කිසිම අපේක්ෂකයකුට ලැබී නොමැති නම්, එක් එක් ගණන් කිරීමේ දී අඩුතම ඡන්ද සංඛ්‍යාව ලබා ගත් අපේක්ෂකයා තරගයෙන් ඉවත් කරමින් සහ—

(අ) තරගයෙන් ඉවත් කරනු ලැබූ අපේක්ෂකයකු සඳහා ඡන්දය දුන් මන්ත්‍රීවරයකුගේ දෙවන මනාපය ; හෝ

(ආ) එකී දෙවන මනාපය දෙනු ලැබ ඇති අපේක්ෂකයා ද තරගයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් ඒ ඡන්දය දුන් මන්ත්‍රීවරයාගේ තුන්වන මනාපය ; හෝ

(ඇ) එකී තුන්වන මනාපය දෙනු ලැබ ඇති අපේක්ෂකයා ද තරගයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් ඒ ඡන්දය දුන් මන්ත්‍රීවරයාගේ ඊළඟ මනාපය

යනා ආදී වශයෙන් වූ මනාප, තරගයේ ඉතිරි අපේක්ෂකයන්ගේ වාසියට එවකටත් ගණන් කර ඇති ඡන්දවලට එකතු කරමින් ද අඩුතම ඡන්ද සංඛ්‍යාව ලබන අපේක්ෂකයා තරගයෙන් ඉවත් කරමින් ද ඡන්ද ගණන් කිරීම තේරීම් භාර නිලධරයා විසින් කර ගෙන යා යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ගණන් කිරීම අවසානයේ දී දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට වැඩි ඡන්ද සංඛ්‍යාවක් කිසිම අපේක්ෂකයකු විසින් ලබා ගෙන නොමැති අවස්ථාවක දී එකී ගණන් කිරීමේ දී බහුතර ඡන්ද සංඛ්‍යාවක් ලබා ගෙන ඇති අපේක්ෂකයා ජනාධිපති ධුරයට තෝරා පත් කර ගනු ලැබූ බව තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

ඡන්ද ගණන සමානවීම.

13. (1) අපේක්ෂකයන් දෙදෙනකු විසින් ලබාගත් ඡන්ද අතර සමානත්වයක් දක්නට ලැබෙන්නාවූ ද එමෙන් ම එක් ඡන්දයක් එකතු කිරීමෙන්, මේ පනත යටතේ ජනාධිපතිවරයා වශයෙන් කිනම් අපේක්ෂකයකු ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු දැයි තීරණය කෙරෙන්නාවූ ද අවස්ථාවක, එසේ තීරණය කිරීමේ කාර්යය සඳහා ඒ අතිරේක ඡන්දය දෙනු ලැබුවේ යයි සලකනු ලැබිය යුතු අපේක්ෂකයා තීරණය කිරීම තේරීම් භාර නිලධරයා විසින් තම පරම අභිමතය අනුව යම් ආකාරයකින් කුසපත් ඇදීමෙන් කරනු ලැබිය යුතු අතර, ඒ අපේක්ෂකයා ජනාධිපති ධුරයට තෝරා පත් කර ගනු ලැබූ බව ඔහු විසින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

(2) අපේක්ෂකයන් දෙදෙනකු විසින් හෝ ඊට වැඩි දෙනකු විසින් ලබා ගත් ඡන්ද අතර සමානත්වයක් දක්නට ලැබෙන්නාවූ ද එමෙන් ම එක් ඡන්දයක් එකතු කිරීමෙන් මේ පනත යටතේ කිනම් අපේක්ෂකයකු ඉවත් නොකළ යුතු දැයි තීරණය කෙරෙන්නාවූ ද අවස්ථාවක, එසේ තීරණය කිරීමේ කාර්යය සඳහා ඒ අතිරේක ඡන්දය දෙනු ලැබුවේ යයි සලකනු ලැබිය යුතු අපේක්ෂකයා තීරණය කිරීම, තේරීම් භාර නිලධරයා විසින් තම පරම අභිමතය අනුව, යම් ආකාරයකින් කුසපත් ඇදීමෙන් කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරී කාලය තුළ දී පුරප්පාඩුව පිහිටීම.

14. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව. ජනාධිපති ධුරයේ පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක දී, නව පාර්ලිමේන්තුව විසින්, එහි පළමු රැස්වීමෙන් එක් මාසයක් ඇතුළත දී ජනාධිපතිවරයා තෝරා පත්කර ගත යුතු ය.

පළමු රැස්වීම නාම යෝජනා දිනය විය යුතු බව.

15. නව පාර්ලිමේන්තුවේ පළමු රැස්වීමේ දී, මහ ලේකම්වරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ප්‍රකාර, ජනාධිපති ධුරයේ පුරප්පාඩුවක් ඇති වී ඇති බව ප්‍රකාශයට පත් කළ යුතු අතර, ඒ රැස්වීමේ දී ඒ පුරප්පාඩුව පිරවීම සඳහා නාම යෝජනා භාර ගනු ලැබිය යුතු ය. 6 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ නාම යෝජනා භාර ගැනීමට අදාළ විය යුතු ය.

ඡන්ද විමසීම, ඡන්ද ගණන් කිරීම, ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප කිරීම ආදිය සඳහා කාර්ය පටිපාටිය.

16. 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන සහ 13 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, 14 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයකු තෝරා පත්කර ගැනීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ගැසට් පත්‍රයෙහි පළ කිරීම.

17. ජනාධිපති ධුරයට තෝරා පත්කරනු ලැබූ බවට ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අපේක්ෂකයාගේ නම ඒ තෝරා පත් කර ගැනීමේ දිනයේ සිට දින තුනක් ඇතුළත දී, මහ ලේකම්වරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

ඡන්ද පත්‍රිකා බැහැර කිරීම.

**18.** මන්ත්‍රීවරයකු, ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ බව ප්‍රකාශයට පත් කරනු ලැබූ පසු, ඡන්ද පත්‍රිකා පෙට්ටියක තැන්පත් කරනු ලැබිය යුතු ය. ඒ පෙට්ටිය, මන්ත්‍රීවරයන් ඉදිරියෙහි දී මුද්‍රා තැබිය යුතු අතර, එය ලිත් මාස හයක් ගත වන තෙක් මහ ලේකම්වරයා භාරයේ තැබිය යුතු ය. ඒ කාලසීමාව ගත වූ පසු, තමාට පාර්ලිමේන්තුවෙන් ලැබිය හැකි යම් විධානයකට යටත්ව, ඒ ඡන්ද පත්‍රිකා විනාශ කිරීමට සැලැස්විය යුතු අතර, ඒ විනාශ කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවට දැනුම් දෙනු ලැබිය යුතු ය.

ඡන්ද පෙත්සමක් මත ඡන්ද විමසීමක් නිෂ්ප්‍රභ කිරීම.

**19.** (1) ජනාධිපති ධුරයට අපේක්ෂකයකු තෝරා පත් කර ගැනීම,—

(අ) තෝරා පත් කර ගනු ලැබූ අපේක්ෂකයා විසින් හෝ තෝරා පත් කර ගනු ලැබූ අපේක්ෂකයාගේ දැනීම ඇතිව සහ ඔහු වෙනුවෙන් වෙන යම් තැනැත්තකු විසින් හෝ ඡන්ද විමසීමේ දී අල්ලස් හෝ අයුතු බලපෑමේ වරදක් සිදුකර ඇති බව : හෝ

(ආ) (i) තෝරා පත් කර ගනු ලැබූ අපේක්ෂකයා නොවන්නා වූ හෝ ඔහුගේ දැනීම ඇතිව සහ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ තැනැත්තකු නොවන්නා වූ හෝ යම් තැනැත්තකු විසින් ඡන්ද විමසීමේ දී අල්ලස් හෝ අයුතු බලපෑමේ වරද සිදු කරනු ලැබ තිබීමේ හේතුව නිසා ; හෝ

(ii) ඡන්දයක් අනිසි ලෙස භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම නිසා ; හෝ

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ මේ පනතේ විධිවිධානවලට අනනුකූල වීම නිසා හෝ

තෝරා පත් කර ගැනීමේ ප්‍රතිඵලය කෙරෙහි සැලකිය යුතු ලෙස බලපා ඇති බව ; හෝ

(ඇ) යම් අපේක්ෂකයකුගේ නාම යෝජනා පත්‍රය වැරදි ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති බව

යන හේතුවලින් ශ්‍රේෂ්ඨාධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කළ හැකි යම් හේතුවක් මත ඡන්ද පෙත්සමක දී ඒ තෝරා පත් කර ගැනීම බලරහිත යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, ඡන්ද විමසීමක දී, අල්ලස් සහ අයුතු බලපෑමේ වරදවල් සම්බන්ධයෙන් 1981 පාර්ලිමේන්තු මැතිවරණ පනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය.

අයුතු බලපෑම සහ අල්ලස් සඳහා දඬුවම් සහ අශක්තතාවන්.

**20.** (1) අයුතු බලපෑම හෝ අල්ලස යන ක්‍රියාව කරන හැම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලැබූ හැම තැනැත්තකු ම, එසේ වරදකරු කරනු ලැබීම හේතුකොටගෙන, එසේ වරදකරු කරනු ලැබූ දින සිට වර්ෂ හතක කාලයකට ඡන්ද හිමියකු

වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට හෝ මේ පනත යටතේ තෝරා පත් කර ගැනීමක දී ඡන්දය දීමට හෝ ජනාධිපති ධුරයට තෝරා පත් කර ගනු ලැබීමට හෝ නුසුදුස්සකු වන්නේ ය.

(3) නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව, මේ පනත යටතේ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

ඡන්ද පෙත්සම්.

21. (1) ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ ඡන්ද පෙත්සමක් මගින් හැර, කිසිම තෝරාපත් කර ගැනීමක් ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(2) එවැනි තෝරාපත් කර ගැනීමක යම් අපේක්ෂකයකු විසින් හෝ පාර්ලිමේන්තුවේ යම් මන්ත්‍රීවරයකු විසින් හෝ 19 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් කරනු ලැබූ එක් හේතුවක් හෝ ඊට වැඩි හේතු සංඛ්‍යාවක් මත තෝරා පත් කර ගැනීමක් ප්‍රශ්න කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) එවැනි යම් පෙත්සමක්, තෝරාපත් කර ගැනීමේ දී තෝරා පත් කරගනු ලැබූ අපේක්ෂකයාගේ නම අඩංගු ප්‍රකාශයක් ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් පසු, එහෙත් ඒ පළ කිරීමේ දින සිට දින තිහකින් පසු නොවන යම් වේලාවක දී ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

පෙත්සම්කරු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි සහන.

22. පෙත්සම්කරුවකු විසින් පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් කවර හෝ ප්‍රකාශයක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය:—

(අ) තෝරාපත් කරගනු ලැබූ අපේක්ෂකයාගේ තෝරා පත්කර ගනු ලැබීම අවලංගු සහ බලරහිත බවට; හෝ

(ආ) තෝරා පත්කර ගනු ලැබූ අපේක්ෂකයාගේ තෝරාපත් කර ගනු ලැබීම බලරහිත බවට සහ තමා අපේක්ෂකයකු වූයේ නම්, තමාම හෝ වෙනත් යම් අපේක්ෂකයකු යථා පරිදි තෝරා පත්කර ගනු ලැබූ බවට.

ශ්‍රේෂ්ඨාධිකරණයේ ආඥා.

23. (1) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඡන්ද පෙත්සම විභාග කිරීම අවසන් කළ පසු,—

(අ) ඡන්ද පෙත්සම නිෂ්ප්‍රභ කරමින්; හෝ

(ආ) තෝරා පත්කර ගනු ලැබූ අපේක්ෂකයාගේ තෝරා පත්කර ගනු ලැබීම බලරහිත බව ප්‍රකාශ කරමින්; හෝ

(ඇ) තෝරා පත්කර ගනු ලැබූ අපේක්ෂකයාගේ තෝරා පත්කර ගනු ලැබීම බලරහිත බව සහ පෙත්සම්කරු අපේක්ෂකයකු වූයේ නම්, ඔහු හෝ වෙන යම් අපේක්ෂකයකු යථා පරිදි තෝරා පත්කර ගත් බව ප්‍රකාශ කරමින්

ලිඛිත ආඥාවක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන අවස්ථාවක දී, ගෙවිය යුතු සම්පූර්ණ ගාස්තු ප්‍රමාණය නියම කරමින් හා ගාස්තු ගෙවිය යුත්තේ කවර තැනැත්තන් විසින් කවර තැනැත්තන්හට ද යන විග සඳහන් කරමින් ආඥාවක් ද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කළ යුතු ය.

ආඥාව කථානායකවරයාට යැවීම.

**24.** 23 (1) වන වගන්තිය යටතේ කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ ආඥාව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කථානායකවරයාට යැවිය යුතු ය.

ආඥාවේ බලපෑම.

**25.** (1) 24 වන වගන්තියෙන් නියම කරනු ලැබූ පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයේ ආඥාව කථානායකවරයාට යවනු ලැබූ විට—

(අ) ආඥාව බලසහිත විය යුතු ය; තවද

(ආ) තෝරා පත් කර ගැනීම හෝ තෝරා පත්කර ගත් බව ප්‍රකාශ කිරීම ස්ථිර කළ යුතු ය. නැතහොත් එය අවලංගු සහ බල රහිත බව ප්‍රකාශ කරනු ලැබිය යුතු ය. තවද කථානායකවරයා විසින් ඒ ආඥාව නොපමාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තෝරා පත්කර ගැනීම අවලංගු සහ බලරහිත බව ප්‍රකාශයට පත් කරනු ලැබුවහොත් අලුත් තෝරා පත්කර ගැනීමක් කිරීමට මහ ලේකම්වරයා විසින් අලුත් ඡන්ද විමසීමක් පැවැත්විය යුතු ය.

(2) 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන සහ 13 වන වගන්තිවල විධිවිධාන, (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය යටතේ ජනාධිපතිවරයාගේ තෝරා පත්කර ගැනීම සහ ඒ සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

## උපලේඛනය

## තෝරා පත්කර ගැනීමේ පත්‍රිකාවේ ආකෘතිය (ඉදිරිපස)

| අපේක්ෂකයාගේ නම | මනාපයේ අංක පිළිවෙළ |
|---|---|
| අ. | |
| ආ. | |
| ඇ. | |
| ඈ. | |
| ඉ. | |

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර ආසක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.